# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය - 2025 (2026)

2024 සහ 2025 වසරවලට නියමිත ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, විභාගය 2026 නොවැම්බර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

**02.** විභාග මධ්‍යස්ථාන :- **උපලේඛනය - 01හි** දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම පිහිටි නගරවල අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී නගරයේ විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

**03.** භාෂා මාධ්‍යය :- මෙම විභාගය දෙමළ, සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි. අයදුම්පතේ සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**04.** සුදුසුකම්:- මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

**4.1** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සමත් වී තිබීම.

**4.2** මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අරාබි විද්‍යාලවලින් නිකුත් කරනු ලබන මව්ලවි සහතිකයක් ලබා තිබීම.

**4.3** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ඉස්ලාම් හෝ ඉස්ලාමීය ශිෂ්ටාචාරය යන විෂයයන් දෙකෙන් එකක් ද ඇතුළුව විෂයයන් තුනකින් සමත් වී තිබීම.

**4.4** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉස්ලාම් විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සමත් අහදියියා පාසලක හෝ අරාබි විදුහලක හෝ වසරකට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ආචාර්යවරයකු වීම.

**05.** අයදුම් කිරීම :-

**5.1** ලියාපදිංචි අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් තැපැල් මඟින් මේ වන විට අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් වෙත යොමුකර ඇති අතර www.doenets.lk වෙබ් අඩවිය මඟින් ද බාගත කර ගැනීමේ පහසුකම් සලසා ඇත.

**5.2** නව අහදියියා දහම් පාසලක් / අරාබි විදුහලක් විසින් අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදංචි සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය.

**5.3** කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න අහදියියා දහම් පාසල හෝ අරාබි විදුහල මඟින් රුපියල් 200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම අයදියියා දහම් පාසල් / අරාබි විදුහල් වෙත ලබා දී ඇත.

**5.4** අදාළ අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර දෙවන පිටපත අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් වෙත තබා ගත යුතුය. අයදුම්පත් දෙකෙහිම අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් අත්සන් කර තිබිය යුතුය.

**5.5** මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

**5.6** අයදුම්පත් භාරගැනීම **2026.08.21** දිනෙන් ආරම්භ වී **2026.09.21** දිනෙන් අවසන් වේ.

**5.7** අයදුම්පත්වල අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේදී උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ සඳහන් ආකාරයටම විය යුතු අතර ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්යය වේ. ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර් ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**5.8** විභාගයට ඉදිරිපත් කරන සියලුම අයදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකව පරීක්ෂා කර බලා අත්සන් කළ යුතු අතර සියලු අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් අහදියියා දහම් පාසලේ විදුහල්පතිවරයා ළඟ තබා ගත යුතුය.

**5.9** අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන විදුහල්පතිවරයා වගකිව යුතුය.

**5.10** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ විදුහල්පතිවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න.

**5.11** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර් ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තතමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතුවේ. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වමත්පස කෙළවරේ "ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය - 2025 (2026)" යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය.

**5.12** තැපෑලේදී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබෙන අතර අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් පිළිබඳ වගකීම අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් විසින් භාර ගත යුතුය.

**06.** විභාග ගාස්තු :- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව **රු. 200/-කි.** එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට අයදුම්කරන විෂයය සඳහා විභාග ගාස්තු **රු. 50/-කි.**

**6.1** විභාග ගාස්තු ගෙවීම :- අදාළ අහදියියා දහම් පාසලේ විදුහල්පති විසින් / අරාබි විදුහලේ විදුහල්පති විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලුම අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු එකතු කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක **20-03-02-13**ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පතේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**6.2** කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

**07.** විභාග ප්‍රවේශ පත්‍ර :- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ අහදියියා දහම් පාසලේ විදුහල්පති වෙත හෝ අරාබි විදුහලේ විදුහල්පති වෙත නිකුත් කරනු ඇත.

**7.1** විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. යම් අයදුම්කරුවකු තම විභාග ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථාන හැර වෙනත් විභාග මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

**7.2** ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, අහදියියා දහම් පාසලේ විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පති විසින් හෝ ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතුය.

**7.3** විභාගය පැවැත්වීමට දින 07කට පෙර විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම අහදියියා දහම් පාසලේ විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පති විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතුය.

1. විභාගයේ නම
2. අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ නම හා දුරකථන අංකය
3. අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ ලිපිනය
4. අහදියියා දහම් පාසලට / අරාබි විදුහලට ලබාදී ඇති පරිගණක අංකය
5. අයදුම්කරුගේ සම්පූර්ණ නම
6. අයදුම් කළ විභාග මධ්‍යස්ථානය / නගරය
7. අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය
8. අයදුම්පත ලියාපදිංචි කළ කුවිතාන්සිය
9. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ පිටපත

**08.** අනන්‍යතාව :- විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**09.** විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**10.** සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :-

මෙම විභාගය සඳහා නියමිත විෂය ගණන පහක් (05) වන අතර, විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් පහම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂයයන් පහෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි විභාග වර්ෂ දෙක (02) ඇතුළතදී එම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය. ඌන සාමර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයයට පමණි.

**10.1** සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ :-

| ලකුණු පරාසය | ශ්‍රේණිය | සංකේතය |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

**10.2** අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ අහදියියා දහම් පාසලේ විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පති වෙත තැපැල් මඟින් එවනු ලැබේ.

**10.3** විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

**11.** සහතික පත්‍ර :- මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර අහදියියා දහම් පාසල් විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පති වෙත තැපැල් මඟින් එවනු ලැබේ. විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණු යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳ අහදියියා දහම් පාසල් විදුහල්පති මඟින් හෝ අරාබි විදුහලේ විදුහල්පති මගින් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයෙන් ලිඛිතව විමසීම කළ යුතුය.

**12.** උත්තර පත්‍ර නැවත සමීක්ෂණය :- අහදියියා දහම් පාසල් විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පතිගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

**13.** විභාගය පිළිබඳ විස්තර :- මෙම විභාගය ප්‍රශ්න ප්‍රශ්න පත්‍ර පහකින් (05) සමන්විත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ කාලය පැය තුනක් (03) බැගින් වේ. එම ප්‍රශ්න පත්‍ර පහත දැක්වේ.

1. අල් අකීදා වල් මසාදිරුෂ් ෂරීආ (ඉස්ලාමීය මූලධර්මය හා නීති මූලාශ්‍ර)
2. අල් ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති පද්ධතිය)
3. අස්සීරා වත්තාරිකුල් ඉස්ලාම් (සීරා සහ ඉස්ලාමීය ඉතිහාසය)
4. අල් අඛ්ලාක් වස්සුලූක් (සමාජ ජීවිතය හා ආචාර ධර්ම)
5. අල් ලුකතුල් අරබියියා වල් අදබුල් ඉස්ලාම් (ඉස්ලාමීය සාහිත්‍යය සහ අරාබි බස)

**14.** ප්‍රශ්න පත්‍ර ව්‍යුහය :-

- එක් එක් ප්‍රශ්න පත්‍රය, I වැනි කොටස, II වැනි කොටස, III වැනි කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.
- I වැනි කොටස සඳහා කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10කින් සමන්විත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් එක් ප්‍රශ්නයට ලකුණු 04 බැගින් හිමි වේ. (ලකුණු $04 \times 10 = 40$)
- II වැනි කොටස සඳහා ව්‍යුහගත ප්‍රශ්න 05කින් සමන්විත වේ. ඉන් කැමති ප්‍රශ්න හතරකට (04) එක් එක් ප්‍රශ්නයට ලකුණු 12 බැගින් හිමි වේ. (ලකුණු $12 \times 04 = 48$)
- III වැනි කොටස සඳහා රචනා වර්ගයේ ප්‍රශ්න දෙකක් (02) අඩංගු වේ. ඉන් කැමති එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතුය. මෙම කොටස සඳහා ලකුණු 12ක් හිමි වේ. (ලකුණු $12 \times 01 = 12$)

**15.** විෂය නිර්දේශය :-
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කොට පැවැත්වීමට නියමිත ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය **උපලේඛනය - 02** ලෙස මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත.

**16.** මූලාකෘති ප්‍රශ්න පත්‍ර :-
මූලාකෘති ප්‍රශ්න පත්‍ර සඳහා "අධ්‍යක්ෂ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව, 180, ටී.බී. ජායා මාවත, කොළඹ 10." යන ලිපිනයෙන් හෝ 011-2667909 / 011-2669994 විමසන්න.

**17.** මෙම නිවේදනයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

**18.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්

2026 අගෝස්තු මස 21 වැනි දින
බත්තරමුල්ල, පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය - 01

| දිස්ත්‍රික්ක අංකය හා දිස්ත්‍රික්කය | නගර අංකය | නගරය |
|---|---|---|
| **01 -** කොළඹ | **101** | කොළඹ |
| **02 -** ගම්පහ | **201** | මීගමුව |
| **03 -** කළුතර | **301** | කළුතර |
| **04 -** මහනුවර | **401** | මහනුවර |
| **05 -** මාතලේ | **501** | මාතලේ |
| **06 -** නුවරඑළිය | **601** | නුවරඑළිය |
| **07 -** ගාල්ල | **701** | ගාල්ල |
| **08 -** මාතර | **801** | මාතර |
| **09 -** හම්බන්තොට | **901** | හම්බන්තොට |
| **10 -** යාපනය | **1001** | යාපනය |
| **11 -** මන්නාරම | **1101** | මන්නාරම |
| **12 -** වව්නියාව | **1201** | වව්නියාව |
| **13 -** මුලතිව් | **1301** | මුලතිව් |
| **14 -** කිලිනොච්චි | **1401** | කිලිනොච්චි |
| **15 -** මඩකලපුව | **1501** | කාත්තන්කුඩි |
| **16 -** අම්පාර | **1601** | අක්කරෙයිපත්තු |
| **17 -** ත්‍රිකුණාමලය | **1701** | කින්නියා |
| **18 -** කුරුණෑගල | **1801** | සියඹලාගස්කොටුව |
| **19 -** පුත්තලම | **1901** | පුත්තලම |
| **20 -** අනුරාධපුරය | **2001** | අනුරාධපුරය |
| **21 -** පොළොන්නරුව | **2101** | පොළොන්නරුව |
| **22 -** බදුල්ල | **2201** | බදුල්ල |
| **23 -** මොනරාගල | **2301** | බිබිල |
| **24 -** රත්නපුර | **2401** | රත්නපුර |
| **25 -** කෑගල්ල | **2501** | කෑගල්ල |

උපලේඛනය - 02

## 01. අල් අකීදා වල් මසාදිරුෂ් ෂරීආ (ඉස්ලාමීය මූලධර්මය හා නීති මූලාශ්‍ර)

1.1 ඉස්ලාමීය අකීදා

1.1.1 ඉස්ලාමීය අකීදා - හැඳින්වීම හා සාමාන්‍ය අවබෝධය

1.1.2 ඉස්ලාමීය අකීදා හි අන්තර්ගතය

1.1.2.1 තව්හීද්
- අල් උලූහියියා
- අල් රුබූබියියා
- අස්මාඋල් හුස්නා තුළින් අල්ලාහ්ගේ ස්වභාව අවබෝධ කර ගැනීම

1.1.2.2 රුහානියියාත්

1.1.2.3 නුබුව්වත්

1.1.2.4 සම්ඉයියාත්

1.1.2.5 කලා කද්ර්

1.1.3 අකීදා ආශ්‍රිත කොටස්

1.2 මසාදිරුෂ් ෂරීආ

1.2.1 මසාදිරුන් නක්ලියියා - හැඳින්වීම

1.1.2 වහි
- වහි හි අවශ්‍යතාව
- වහි වර්ග

1.2.3 අල් කුර්ආන්

1.2.3.1 - පහළවීම හා ගොනු කරනු ලැබීම
- තර්තීබ් නුසූල්
- තර්තීබ් තිලාවත්

1.2.3.2 - ව්‍යුහය
- මක්කි මදනි
- නාසික් මන්සූක්
- මුහ්කම්
-මුතෂාබිහ්
- අස්බාබුන් නුසූල්

1.2.3.3 - ඉඃජාසුල් කුර්ආන්
- භාෂාව පදනම් කර ගත් මූලික
- නීති මූලික
- විද්‍යා මූලික

1.2.3.4 - තෆ්සීර් විද්‍යාව
- ආරම්භය හා වර්ධනය
- තෆ්සීර් වර්ග (මන්කූල්, මඃකූල්, නූතන තෆ්සීර් වර්ග)

**1.2.3.5 - අල්කුර්ආන් හා සම්බන්ධතාව**
- අල් කුර්ආනයට ලඟාවන ආකාරය
- අල් කුර්ආනයේ පරමාර්ථ
- අල් කුර්ආනයේ හදාරන ආකාරය

**1.2.4 අස්සුන්නා**

**1.2.4.1 - පදාර්ථය හා ව්‍යවහාරික විස්තර**

**1.2.4.2 - නීති මූලාශ්‍රයක් වශයෙන් සුන්නාව**

**1.2.4.3 - හදීස් සංරක්ෂණය**
- නබි (සල්) තුමාගේ කාලය
- සහාබාවරුන්ගේ අවධිය
- තාබිඊන්වරුන්ගේ අවධිය
- තාබිඋත්තාබිඊන්වරුන්ගේ අවධිය
- නූතන අවධිය

**1.2.4.4 - හදීස් ආශ්‍රිතව බිහිවූ විද්‍යාවන් හා ඒවායේ ප්‍රතිඵල**
- අස්මාඋර් රිජාල්
- ඉල්මුර් ජරාහ් වත්තඃතීල්
- උසූලුල් හදීස්

**1.2.4.5 - හදීස් අවබෝධ කර ගැනීම**
- හදීස් සමස්ථ ජීවිතයටම මග පෙන්වීමක්
- හදීස් ග්‍රන්ථ

**1.2.4.6 - හදීස් වෙත ළගාවීම**
- විවිධ ක්ෂෙත්‍රවලට අදාළ හදීස් අවබෝධ කරගැනීම (පරිසරය සංරක්ෂණය, සෞඛ්‍ය ආරක්ෂාව, ආර්ථිකය, විද්‍යාව)

**1.2.5 සහායක මූලාශ්‍ර**

**1.2.5.1 - ඉජ්තිහාද්**
- පදාර්ථය හා ව්‍යවහාර විස්තරය
- ඉජ්තිහාදයේ අවශ්‍යතාව
- නීති ගුරුකුලයන්
- (මද්රසතුල් අසර් මද්රසතුර්රඋයු)

**1.2.5.2 - මුජ්තහිද්වරුන්**
- සුදුසුකම් හා වර්ග
- ඔවුන්ගේ දායකත්වය
- මද්හබ් බිහිවීම හා වර්ධනය

**1.2.5.3 - සහායක මූලාශ්‍ර**
- යාන්ත්‍රණ හා යෙදවුම්
- ඉජ්මා, කියාස්, මස්ලහා, මුර්සලා, උර්ෆ්, ෂරඋ,සාබිකා, ඉස්තිහ්සාන්, ඉස්තිස්හාබ්, කව්ලුල්සහාබා, සද්දුස් සරාඉ

## 02. අල් ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති පද්ධතිය)

**2.1** ඉබාදත්

**2.1.1** තහාරත්
- නජීස් පිළිබඳ විස්තර

**2.1.2** ඉබාදත්
- පදාර්ථය හා ව්‍යවහාරය
- ඉබාදත් වර්ග හා එහි මූලධර්ම
- ඊමාන් හා ඉබාදතය අතර සබඳතාව

**2.2** මූලික ඉබාදතයන්

**2.2.1** සලාතය
- වැදගත්කම
- වර්ග
- පිළිවෙත්
- ප්‍රයෝජන

**2.2.2** සකාත්
- වැදගත්කම
-පිළිවෙත්
- ප්‍රයෝජන
- සකාතය ආයතනගත කිරීමේ අවශ්‍යතාව
- සකාතුල් ෆිත්ර්

**2.2.3** සව්මය
- වැදගත්කම වර්ග
- පිළිවෙත්
- ප්‍රයෝජන

**2.2.4** අල්හජ්
- වැදගත්කම
- පිළිවෙත්
- ප්‍රයෝජන

**2.2.5** සෙසු ඉබාදතයන්
- සදකා
- උම්රා
- තිලාවතුල් කුර්ආන්
- තව්බා ඉස්තිඃපාර්
- දික්ර් අව්රාද් දුආ
- කව්ෆ්, රජා, රීලා, තවක්කුල්, වරඋ, සුහ්ද්
- සියාරතුල් කුබූර්
- කුර්බානීන්

**2.3** මුආමලාත්

**2.3.1** ඉස්ලාමීය ආර්ථිකය
-හැඳින්වීම
-සුවිශේෂ ලක්ෂණ

**2.3.2** ඉපැයීම හා වියදම් කිරීම
- ඉපැයීමේ වැදගත්කම
- කෘෂිකර්මය (මුසාරආ - ඉහ්යාඋල් මමාත්)
- කර්මාන්ත

**2.3.3** වෙළදාම
- වැදගත්කම
-ඉස්ලාම් අනුමත කර ඇති වෙළදාම් ක්‍රම (සම්සරා බෛඋත් තක්සීද්, මුලාරබා, මුෂාරකා, මුරාබහා, ඉජාරා, රහ්න්)
-නූතන වෙළදාම් ක්‍රම (අනෙකුත් වෙළදාම් ක්‍රම හා සැසඳීම) නිදසුන් : බැංකු, රක්‍ෂණය)

**2.3.4** ඉස්ලාම්හි තහනම් (හරාම්) කර ඇති ව්‍යාපාර කටයුතු
- බාල කිරීම්
- සගවා තැබීම්
- රැවැට්ටීම
- අල්ලස
- සූදුව
- පොළිය
- හරාම් වූ ද්‍රව්‍ය විකිණීම

**2.4** මුනාකහාත්

**2.4.1** නිකාහ්
- නිකාහ් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය
- නිකාහ්
- නීති රීති
- බහු භාර්යා විවාහය

**2.4.2** පවුල
- පවුල් ජීවිතයේ වැදගත්කම
- අඹු සැමි සබඳතා
- වගකීම් හා අයිතිවාසිකම්
- දරුවන් හදාවඩා ගැනීම පිළිබඳ උපදෙස් හා ම`ගපෙන්වීම්
- පශ්චාත් හිමිකම්/දෙමාපියන් හා  දරුවන්ගේ වගකීම් හා අයිතිවාසිකම්

**2.4.3** දික්කසාදය
- දික්කසාදය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය
- වර්ග හා පිළිවෙත්
- ඉද්දා විස්තරය නීති රීති නඩත්තුව **2.5** ජිනායාත්

## 03. අස්සීරා වත්තාරිකුල් ඉස්ලාම් (සීරා සහ ඉස්ලාමීය ඉතිහාසය)

**3.1** ඉතිහාසය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය ඉස්ලාමීය ඉතිහාසයේ සුවිශේෂ ලක්ෂණ

**3.2** ඉතිහාස අවධි

**3.2.1** නබි (සල්) තුමන්ගේ අවධිය - නබි (සල්) තුමාට පෙර අවධිය
- නබි (සල්) තුමාගේ මක්කා ජීවිත කාල පරිච්ඡේදය
- නබි (සල්) තුමාගේ මදීනා ජීවිත කාල පරිච්ඡේදය

3.2.2 කුලෆාඋර්රාෂිදින්වරුන්ගේ කාල පරිච්ඡේදය - කලීෆාවරුන් තෝරා පත් වූ ආකාරය
- රාජ්‍ය විකාශයට තුඩුදුන් හේතුන් සහ විකාශ වූ ආකාරය
- පාලන, මූල්‍ය, අධිකරණ ආයතන
- මුහුණදුන් අභියෝග
- කලීෆාවරුන්ගේ පෞරුෂ ලක්‍ෂණ හා ආදර්ශ

3.2.3 පසු කාලීන කලිෆාවරුන්ගේ කාල පරිච්ඡේදය

3.2.3.1 උමයියා අවධිය
- උමයියාවරුන්ගේ පිබිදීම
- ප්‍රධාන කලීෆාවරු
- පෞරුෂ ලක්ෂණ හා දායකත්වය (මු. ආවියා, අබ්දුල් මලික්, වලීද්, උමර් ඉබ්හු අබ්දුල් අසීස්)
- රාජ්‍ය විකාශය එහි ප්‍රතිඵල
- මුහුණදුන් ගැටළු

3.2.3.2 අබ්බාසිවරුන්ගේ කාල පරිච්ඡේදය
- අබ්බාසිවරුන්ගේ පිබිදීම
- ප්‍රධාන කලීෆාවරු හා දායකත්වය
(මන්සූර්, හාරූන්, ම:මූන්)
පසු කාලීන කලීෆාවරුන්ගේ පාලනය
- කුලෆාඋර්රාෂිදින්වරුන්ගේ පාලනය හා සැසඳීම

3.2.3.3 අනෙකුත් රාජ්‍යයන්
- ස්පාඤ්ඤයේ උමයියා පාලනය
- ඉන්දියාවේ මෝගල් පාලනය
- තුර්කියෙහි උස්මානිය පාලනය

3.2.3.4 වර්තමාන මුස්ලිම් ලෝකය

3.3 ඉස්ලාමීය කලාවන්

3.3.1 විද්‍යාත්මක කලාවන්
- විද්‍යාත්මක කලාවන් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය
- පහත දැක්වෙන කලාවන්හි වර්ධනය හා නිර්මාණාත්මක
- දායකත්වය : දර්ශනය, වෛද්‍ය විද්‍යාව, ඉතිහාසය, ගණිතය, භූගෝල විද්‍යාව, තාරකා විද්‍යාව

3.3. 2 සෞන්දර්යාත්මක කලාවන් - සෞන්දර්යාත්මක කලාවන්
- සෞන්දර්ය කලා පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය
- පහත දැක්වෙන කලාවන් බිහිවීම සහ වර්ධනය (කිරාඅත් කලාව, කැලිග්‍රාෆි අක්ෂර කලාව අරබෙස්ක්
- වාස්තු
විද්‍යාව, මිනියේචර් කලාව සංගීත කලාව)

3.4 ඉස්ලාමීය ඉතිහාසයේ මස්ජිද්වල දායකත්වය මස්ජිද් බිහිවීම හා එහි කාර්යයන් පහත සඳහන් මස්ජිද් බිහිවීම හා ඒවායෙහි වැදගත්කම මස්ජිදුල් හරම් - මස්ජිදුන් නබවි - මස්ජිදුල් අක්සා

3.5 ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය

3.5.1 අරාබිවරුන්ගේ පැමිණීම

3.5.2 ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබීම

3.5.3 ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්
- ජනගහන විකාශය හා පැරණි සහ නව ජනාවාස
- ජාතික මට්ටමේ දායකත්වය

**3.5.4.**ආගමික හා සමාජීය ආයතන - මස්ජිද්
- මුස්ලිම් පුද්ගල නීතිය
- වක්ෆු විවාහය බිඳීම පිළිබඳ නීති රීති
- ක්වාසි අධිකරණය හා අභියාචනා ක්වාසි සභාව
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**3.6** ඓතිහාසික මුස්ලිම් පෙර ගමන්කරුවන්

**3.6.1** සහාබාවරුන් (මුස්අබ් ඉබ්නු උමෛර් (රලි) බිලාල් (රලි), සෛද් ඉබ්නු සබිද් (රලි) දුල් බිජාදෛන්(රලි) උම්මු අමාරා (රලි), අස්මා බින්ති අබුබක්කර්(රලි) ෆාතිමා (රලි)

**3.6.2** තාබිඊන්වරුන් ඉමාම්වරුන් (උමර් ඉබ්නු, අබ්දුල්අසීස්, සායිද් ඉබ්නු මුෙසෙයද් අතා ඉබ්නු අබි රබාහ්, ඉමාම් සුහ්රි)

**3.6.3** චින්තකයින්, ප්‍රතිසංස්කරණවාදීන්, අබ්දුල් කාදිර් ජීලිනි, ඉමාම් ගස්සාලි, අබුල් හසන් ෂාදුලි, ඉබ්නුල් කෙයුම් අල් ජව්සි මුහම්මද් ඉබ්නු අබ්දුල් වහ්හාබ්, මෞලානා ඉල්යාස්, ඉමාම් හසනුල් බන්නා, මෞලානා මෞදූදි

## 04. අල් අඛ්ලාක් වස්සුලූක් (සමාජ ජීවිතය හා ආචාර ධර්ම)

**4.1** සමාජ ජීවිතය

**4.1.1** හැඳින්වීම
- මිනිසා, විශ්වය, ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය

**4.1.2** පුද්ගලයා
- සමාජයේ පුද්ගලයාගේ දායකත්වය
- සමාජය කෙරෙහි පුද්ගලයාගේ වගකීම්

**4.1.3** පවුල
- පුද්ගලයා සහ පවුල
- මුස්ලිම් සමාජයීය ක්‍රමයේ පුද්ගලයාගේ කාර්ය භාරය
- පුද්ගලයා ගොඩනැංවීමෙහිලා පවුලේ දායකත්වය හා කාර්ය භාරය
- ඥාති සබඳතා
- ඥාතින් හා අසල්වැසියන්

**4.1.4** සමාජය
- ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ ලක්‍ෂණ (සමානාත්මතාව සහෝදරත්වය, නිදහස, යුක්තිය)
- පුද්ගලයා සහ සමාජය (අයිතිවාසිකම්)
- යහ ක්‍රියා වර්ධනය කිරීම
- අයහපත් ක්‍රියා වැළැක්වීම
- ඉස්ලාමීය පුහුණුකරුවන්ගේ ලක්‍ෂණ හා කාර්යභාරය
- බහු වාර්ගික සමාජයෙහි මුස්ලිම්වරුන්ගේ සබඳතාව
- දුබලයින්ට ආරක්‍ෂාව
- කියා සඳහා මාර්ගෝපදේශ
- සමාජ ආචාරධර්ම (ඉවසා දරා ගැනීම,නම්‍යශීලි බව, තවාසුන්, නායකත්වයට ගරු කිරීම, සමාජ සන්නිවේදනය)
- සමාජ සබඳතාව තහවුරු කරන හා දුර්වල කරන කරුණු

**4.2** ආචාර ධර්ම

**4.2.1** අල්ලාහ් සමග සබඳතා
- ඉඛ්ලාස්
- තක්වා (දේව භක්තිය)
- තවක්කුල්
- අල්ලාහ්ගේ තීන්දුව සහ කැමැත්ත සතුටින් භාර ගැනීම
- අල්ලාහ් කෙරෙහි දයාව දැක්වීම
- කෙළෙහිගුණ දැක්වීම

**4.2.2** මිනිස් සබඳතා සමාජ ආචාරධර්ම
- සහෝදරත්වය
- සත්‍යවන්තභාවය
- අවංකභාවය
- සමාව දීමේ ආකල්පය
- පාරිශුද්ධභාවය/පිරිසිදුකම
- සෙනෙහස
- ලැජ්ජාශීලි බව
- ඉවසීම

**4.2.3** අනෙකුත් ජීවීන් හා භෞතික වස්තූන් පිළිබඳ ආචාරධර්ම
- ජීවින් කෙරෙහි ආදරය දැක්වීම හා ඔවුන්ගේ සුභ සිද්ධියට කටයුතු කිරීම
- භෞතික පරිසරය සුරැකීම
- රටේ යහපත සුරැකීම
- ආපදා කළමනාකරණය

## 05. අල් ලුකතුල් අරබියියා වල් අදබුල් ඉස්ලාම් (ඉස්ලාමීය සාහිත්‍යය අරාබි බස)

**5.1** ඉස්ලාමීය සාහිත්‍යය

**5.1.1** ඉස්ලාමීය සාහිත්‍යයේ සංකල්ප හා මූලධර්ම නූතන ඉස්ලාමීය සාහිත්‍ය හැඳින්වීමක්

**5.2** පහත දක්වා ඇති අය ඉස්ලාමීය සාහිත්‍යට දැක්වූ දායකත්වය

දෙමළ භාෂා මාධ්‍යයෙන් :-
- එම්. සී. සිද්දි ලෙබ්බෙ
- ආචාර්ය එම්. එම්. උවයිස්
- ඒ. එම්. ඒ. අසීස්
- උමර් හස්රත්
- යූ. එම්. තාසිම්
- අබ්දුල් කාදර් ලෙබ්බෙ කවියා

සිංහල භාෂාව තුළින් :-
- ආචාර්ය එම්. එම්. උවයිස්
- එස්. එම්. මන්සූර්
- ඒ. එම්. ෂාහුල් හමීද්
- එම්. එම්. එම්. ෂම්ස්
- එම්. ඒ. මුහම්මද් මාස්ටර් (දික්වැල්ල)
- මාතර කාසිම් කවියා

**5.3** අරාබි දෙමළ

**5.3.1** අරාබි දෙමළ
- හැඳින්වීම අරාබි දෙමළ
- ආරම්භය හා වර්ධනය

**5.3.2** පහත කෘතිපිළිබඳ අවබෝධය
- ෆක්හුද්දයියාන්
- ආලිමුල් අරූස්
- තෆ්සීර් ජ් ෂෙයිකු මුස්තාෆා (බේරුවල)
- ඉබ්නු නුෆාදාගේ කුත්බා
- මීසාන් මාලේ
- තෙලෙ ෆාතිහා
- තක්කසුරුක්

**5.4** අරාබි බස

**5.4.1** භාෂා කුසලතා වර්ධනය
- සවන්දීම
- කථනය/කථා බහ
- කියවීම
- ලිවීම

**5.4.2** එදිනෙදා ජීවිතයේ භාවිතා කළ හැකි වදන් හා වාක්‍යාංශ
-කෙටි වාක්‍ය

**5.4.3** අරාබිය සිංහලට හෝ දෙමළට හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම හා සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි අරාබියට පරිවර්තනය කිරීම

**5.4.4** දෙන ලද ජේදයට අදාළව අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
- දෙන ලද ජේදයට පිල්ලම් යෙදීම

**5.4.5** අල්කුර්ආන්, සුන්නා සාහිත්‍ය රස විඳීම
- මුෆ් රදාතුල්, කුර්ආන්
- සිද්ධි වාචනය

**5.4.6** අහ්කාමුත් දජ්වීද්
- තජ්වීද් නීති රීති

**5.4.7** ව්‍යාකරණ පිළිබඳ දැනුම

**5.4.7.1** අස්සරෆු - අතීත කාල වර්තමාන කාල ක්‍රියා
- උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ ක්‍රියා
- ලිංග භේද, වචන භේද, බහු වචන ප්‍රභේද
- විධි ක්‍රියාව
- අතීත කාල, වර්තමාන කාල, කර්ම කාරක ක්‍රියා
- ක්‍රියා මූල (මස්කර්)
- ඉස්මු ෆාඉල් / ඉස්මු මෆ්ඌල්
- බහු වචන විවිධත්වය

### 5.4.7.2 අන්නහ්වු

- අල් මුෆ්තදා, වල් කෆර්
- අල් ෆිඅල් වල් ෆා ඉල්
- අස්මාඋල් ඉෂාරා
- අස්සිෆාත්
- හුරුෆුල් ජර්රු
- අල් මුලාෆ් වල් මුලාෆ් ඉලයිහි
- කාන වඅකවාතුහා
- ඉන්න ව අකවාතුහා
- අල් හාල්